ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

இலங்கையின் பிரதம அமைச்சர்

Prime Minister of Sri Lanka

ශෝක පණිවුඩය

ජනතාවාදී සටන්කරුවකුගේ නික්මයාම...

ජාතික ජන බලවේගයේ මෙහෙයුම් කමිටුවේ සහ ජාතික විධායක සභාවේ සාමාජිකයකු වන, ජ්‍යෙෂ්ඨ නීතිඥ ලාල් විජේනායක සහෝදරයාගේ අභාවය පිළිබඳ ප්‍රවත සැලවීමෙන් මම මහත් සංවේගයට පත්වීමි.

වාමාංශික දේශපාලනඥයකු, ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු මෙන්ම මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ සාධාරණත්වය වෙනුවෙන් සිය ජීවිත කාලයම කැප කළ විද්වතකු ලෙස ඔහු මෙරට සමාජ හා දේශපාලන ඉතිහාසය තුළ ඉටු කළ මෙහෙවර කිසිදා අමතක කළ නොහැකිය. සිය 85 වසරක ජීවිත ගමන පුරාවට ඔහු පෙනී සිටියේ තමන් විශ්වාස කළ ප්‍රතිපත්ති වෙනුවෙනි. බලය හෝ තනතුරු ඉදිරියේ නොසැලී, තමන් නිවැරදි යැයි විශ්වාස කළ මතවාදයන් වෙනුවෙන් අවංකව පෙනී සිටීම ඔහුගේ දේශපාලන ජීවිතයේ කැපී පෙනෙන ලක්ෂණයක් විය.

ලාල් විජේනායක සහෝදරයා මා හට පළමුව මුණගැසුණේ 2016 වසරේදී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ අරමුණින් පත්කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවේදී ය. එතැන් සිට අපි එකම පොදු දේශපාලන මතවාදයක් වෙනුවෙන් එක්ව පෙනී සිටියෙමු. එක්ව හඬ නැඟුවෙමු. ඒ ඇසුර ඔහු සතු දේශපාලන අවංකභාවයත්, ප්‍රතිපත්තිගරුකභාවයත්, සමාජය පිළිබඳ වූ ගැඹුරු දැක්මත් සමීපව අත්විඳීමට අවස්ථාව සැලසීය.

දේශපාලනය යනු හුදෙක් බලය හෝ තනතුරු අත්පත් කරගැනීමක් නොව, ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමේ සහ වඩා සාධාරණ සමාජයක් ගොඩනැඟීමේ අරගලයක් බව සිය ජීවිතයෙන්ම පෙන්වා දිය හැකි මිනිසුන් අපට අවශ්‍යය. ලාල් විජේනායක සහෝදරයා එවැනි දේශපාලන ජීවිතයකට උරුමකම් කී පුද්ගලයෙකි. එවැනි මිනිසුන්ගේ අත්දැකීම්, දැනුම සහ දේශපාලන පරිණතභාවය අනාගත පරම්පරාවන්ට ද මහත් ආදර්ශයකි. ප්‍රතිපත්ති වෙනුවෙන් නොසැලී සිටින, ජනතාව වෙනුවෙන් අවංකව හඬ නහන මිනිසුන් තව තවත් අවශ්‍යව ඇති යුගයක ඔහුගේ නික්මයාම අපට පිරිමැසිය නොහැකි හිඩැසකි.

සහෝදර ලාල් විජේනායකයන්ගේ ජීවිතයෙන් අපට ඉතිරි වන වටිනාම උරුමය වන්නේ ඔහු පෙනී සිටි මානවවාදී දේශපාලන දැක්මත්, යුක්තිය සහ සාධාරණත්වය වෙනුවෙන් වූ නොසැලෙන කැපවීමත්ය. ඒ උරුමය ඉදිරියට ගෙන යාම ඔහුට දැක්විය හැකි සැබෑ උපහාරය වනු ඇත. ඔහුගේ දේශපාලන භාවිතය සමඟ අප එකඟ වූ මෙන්ම එකඟ නොවූ මතවාදී අවස්ථා ද තිබිණ. ඒ කිසි විටෙකත් ඔහු පිළිබඳ අප තුළ වූ මිත්‍රත්වය, සහෝදරත්වය සහ ගෞරවයේ අඩුවක් නොවූ බව මෙහි දී කිව යුතුම ය.

ලාල් විජේනායක සහෝදරයාණෙනි, ඔබේ නික්මයාමෙන් ඇති වූ හිඩැස පුරවාලීම පහසු නොවනු ඇත.

ඔබට මාගේ ආදරයත්, ගෞරවයත් පිරි සහෝදරාත්මක ආචාරය...

ආචාර්ය හරිනි අමරසූරිය
අග්‍රාමාත්‍ය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය